අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය
(2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත යටතේ ස්ථාපිත කර ඇත)

පුරප්පාඩු

අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරුප්පාඩු පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. <u>ප්‍රධාන විධායක නිලධාරී (CEO) (පුරප්පාඩු 1)</u>

සුදුසුකම්

සියලු අයදුම්කරුවන් පහත **i** හෝ **ii** යටතේ අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතුය

i. නීතිය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, ආර්ථික විද්‍යාව, මූල්‍ය කළමනාකරණය, වාණිජ යන විෂය ක්ෂේත්‍රයකින් හෝ මෙම තනතුරට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සහ

නීතිය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, ආර්ථික විද්‍යාව, මූල්‍ය කළමනාකරණය, වාණිජ හෝ මෙම තනතුරට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් **(Masters)** ලබා තිබීම

සහ

පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක**,** ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර විස්ස **(20)** ක පළපුරුද්දෙන්, ජ්‍යෙෂ්ඨ විධායක/ඉහල කළමනාකරණ මට්ටමේ වසර පහක **(05)** පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම

ii. නීතිය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, ආර්ථික විද්‍යාව, මූල්‍ය කළමනාකරණය, වානිජ යන විෂය ක්ෂේත්‍රයකින් හෝ මෙම තනතුරට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සහ

අදාළ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් **(PhD)**ලබා තිබීම

සහ

ආචාර්ය උපාධිය **(PhD)** ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක**,** ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ විධායක/ඉහල කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර පහක **(05)** පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම

වයස

අවු: **35** ට නොඅඩු හා අවු: **55** ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය

රු. 500,000 - රු. 25,000 x 9 – රු. 725,000

නිල රථයක් සහ රජයේ අනුමත ඉන්ධන දීමනාවට හිමිකම් සහිතය

2. <u>අධ්‍යක්ෂ (පාලන හා මුදල්) (පුරප්පාඩු 1)</u>

සුදුසුකම්

i. ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය**,** වාණිජ, මූල්‍ය, ගිණුම්කරණය හෝ මෙම තනතුරට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම

සමඟ

ව්‍යාපාර කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය**,** වාණිජ, මූල්‍ය, ගිණුම්කරණය හෝ තනතුරට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධියක් **(Masters)** ලබා තිබීම

හෝ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ**,** පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම

සහ

පළමු උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ**,** රාජ්‍ය සංස්ථාවක**,** මණ්ඩලයක**,** ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ‘‘කළමනාකාර මට්ටමේ’’ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දොළහ **(12)** ක පළපුරුද්දක් ලබා තිබීම.

වයස

අවු: **35** ට නොඅඩු හා අවු: **55** ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය

HM 1-1 – 2025 - රු. (140,640 - 15 x 4,100 - 202,140)

නිල රථයක් සහ රජයේ අනුමත ඉන්ධන දීමනාවට හිමිකම් සහිතය

3. <u>අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් (පුරප්පාඩු 1)</u>

සුදුසුකම් (පහත **i** හෝ **ii)**

i. නීතිය, කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, වාණිජ හෝ තනතුරට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම

සමඟ

සමාගම් ලේකම් සහ ආයතනික පාලනය පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් වෘත්තීය සුදුසුකමක් සහ, සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සමාගම් ලේකම් කටයුතු සහ ආයතනික පාලනය සම්බන්ධයෙන් අවම වශයෙන් වසර එකක (01) සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ii. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ වෘත්තියෙහි නිරත වීම සමඟ සමාගම් ලේකම් කටයුතු සහ ආයතනික පාලනය සම්බන්ධයෙන් අවම වශයෙන් වසර එකක (01) පසු සේවා පළපුරුද්දක් ලබා තිබීම

වයස

අවු: 22 ට නොඅඩු හා අවු: **45** ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය

MM 1-1 - 2025 - රු. (91,690 - 10 x 2,480 - 15 x 3,450 – 168,240)

<u>පොදු කොන්දේසි</u>

අ. සෑම ඉල්ලුම්කරුවෙක්ම,

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

ආ. සියලු අයදුම්කරුවන් අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පසු තෝරා ගැනීම සිදු කෙරේ.

ඇ. ඉහත සුදුසුකම් සහ තනතුරට අදාළ පළපුරුද්ද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර සනාථ කෙරෙන සහතිකපත්වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා අයදුම්පත සමඟ එවිය යුතුය. (සහතිකපත්වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඈ. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අවසන් දින පසු වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සලකනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

ඉහත තොරතුරු ඇතුළත්, අයදුම්කරු පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකතන අංකයන් ඇතුළත් කරන ලද සම්පූර්ණ ජීව දත්ත සටහනක් ද සහිත අයදුම්පත **2026 නොවැම්බර් 14** දින හෝ ඊට පෙර පහත ලිපිනයට (ලියාපදිංචි තැපෑලෙන්) ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"(අයදුම් කරන තනතුර), අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය"** ලෙස පැහැදිලිව සඳහන් කර යොමු කළ යුතුය.

සභාපති
අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරිය
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
නො. 19, ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10